පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සබරගමුව- සතිපාසල

සතිය- 11

විෂය:- නර්තනය

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

# මනිපුරි නර්තන සම්ප්‍රදාය



විදේශීය නර්තන සම්ප්‍රදායයන් පිළිබඳ විමසීමේ දී පෙරදිග ලෝකයේ ප්‍රධාන වන භාරතීය නර්තන කලාවට ඉන් සුවිශේෂී තැනක් හිමි වේ.ඉන්දියාවේ නර්තන සම්ප්‍රදායයන් රැසක් ඇති අතර මහා සම්ප්‍රදායයන් ලෙස ගැනෙන භරත,කතක්,කතකලි හා මනිපුරි යන නර්තන සම්ප්‍රදායයන් ප්‍රධාන තැනක් ගනී.

භාරතීය නර්තන කලාවට අයත් එක් නර්තන අංගයක් වන මනිපුරි නර්තන සම්ප්‍රදායේ ආරම්භය,ප්‍රචලිත ප්‍රදේශ ,නර්තන අංග,රංග වස්ත්‍රාභරණ ,උගන්වන ප්‍රධාන ආයතනය හා ඊට පුරෝගාමී වූ පුද්ගලයන් පිළිබඳ විමසමු.

ඉතා මටසිලුටු නම්‍යශීලිත්වයෙන් යුතු ලාස්‍ය අංග චලන භාවිතයක් දක්නට ලැබෙන මනිපුරි නර්තන ශෛලිය උත්තර භාරතීය ඊශාන දිග මනිපුරි ප්‍රාන්තයේ ජන්මය ලැබූ පැරණි නර්තන සම්ප්‍රදායකි.



# මනිපුරි නර්තනය

## <u>හැදින්වීම</u>

- ඊශාන දිග භාරතයේ " බ්‍රහ්ම පුත්‍ර " නදියටත් ඇසෑමයටත් අතර මැද පිහිටි මනිපුරි නම් වූ මිටියාවත පසු කාලයේ මනිපුරි ප්‍රාන්ත රාජ්‍ය ලෙසට පත්විය.මෙහි වැඩි දෙනාගේ ජීවනෝපාය ගොවිතැන වේ.

- මනිපුරි වැසියෝ සාමකාමී නිහඬ බවක් ඇති අය මෙන් ම නර්තනය තම ජීවිතය සේ පවත්වා ගෙන යාමට පුරුදුව සිටියහ.








- මනිපුරි නර්තන සම්ප්‍රදාය සම්පූර්ණයෙන් ම ආගමික හා සමාජයීය පසුබිමක් මත ගොඩ නැගී ඇත.මනිපුරි දේශය බිහිවීම පිළිබඳ විවිධ රසවත් කතා පුවත් ගොඩ නැගී ඇත.

- මනිපුරයේ නිර්මාණය සම්බන්ධයෙන් ඉතා රසවත් කථාන්තර ගෙතී ඇති අතර එය දේව සංකල්පයක් මත


01.ශිව දෙවියන් හා පාර්වතී දේවිය සම්බන්ධ කතා පුවත්



02. රාධා හා ක්‍රිෂ්ණාගේ ප්‍රේමාන්විත කතා පුවත්




- **20 වන  සියවසේ මුල් භාගයේ දී (1919)  මනිපුරි දේශයේ සංචාරය කළ රබීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් මෙම නර්තන ශෛලිය ශාන්ති නිකේතනයේ විෂයයක් වශයෙන් ඉගැන්වීම ආරම්භ කරන ලදී.**









# <u>මනිපුරි නර්තන සම්ප්‍රදායයේ සංගීතය</u>

- උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුකූලව පසුබිම් සංගීතය සකස් වී ඇත.

- මනිපුරි නර්තනය සඳහා භාවිතා වන පසුබිම් සංගීත භාණ්ඩ හතරක් දක්නට ලැබේ.

**01.පුංග් බෙරය (පුංග් වාද්‍ය භාණ්ඩය)**





- **ලීයෙන් සකස් කර ඇත.**
- **මැදින් මහත්ව දෙකෙළවර සිහින්ව සකසා ඇත.**
- **ඉතා ළඟින් ළඟ වරපට යොදා ඇත.**
- **එක් ඇසක් අඟල් 06 සහ අනෙක් ඇස අඟල් 04ක විෂ්කම්භයෙන් යුක්තය.**
- **දෙපසෙහිම බඳාම යොදා ගෙන ඇත.**
- **වාදනය කරන අවස්ථාවේ දී සුදු රෙදි කඩකින් බඳආවරණය කරයි.**

02.බට නලාව

03.හක්ගෙඩිය





04.තාලම්පට



තාල නම් වූ ලෝහමය තාලම්පට

( පසුබිම් වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදා ගැනේ.)

## 05.එස්රාජය




“පෙනා ”වාද්‍ය භාණ්ඩය (දේවාලවල ගැයෙන ස්තෝත්‍ර සඳහා)

මෙය පෙනකොම්බා යනුවෙන් ද හඳුන්වනු ලැබේ.මෙය තත් වාද්‍ය භාණ්ඩයකි


පෙනා (පෙනකොම්බා )





## පැවරුම

**01.මනිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රභවය ලැබුවේ කුමන ප්‍රදේශ මුල් කරගෙනද?**



**02. මනිපුරි නර්තන සම්ප්‍රදාය සඳහා යොදා ගන්නා සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරන්න.**

**03.මනිපුරි නර්තනය ඉන්දියාවේ ඉගැන්වීම් කරන ආයතනය නම් කරන්න.**

**04.” පුංග් ” වාද්‍ය භාණ්ඩය සකසා ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.**

**05. ”පුංග් ” වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් අඳින්න.**

සැකසුම

**කේ.එච්.එච්.ජී දිල්රුක්ෂි කුමාරි සෙනවිරත්න**

**කෑ /රංවල මහානාග ම.වි**

**කෑගල්ල කලාපය**